# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,486 - 2026 අප්‍රේල් මස 24 සිකුරාදා - 2026.04.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී. )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත. )


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... | — |
| තොටුපළ් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් | |


*සැ. යු.* - (i) ජාතික පාරිසරික (සංශෝධන) පනත් කෙටුම්පත 2026 අප්‍රේල් මස 17 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) විදුලි සංදේශ බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2026 අප්‍රේල් මස 17 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(iii) මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත 2026 අප්‍රේල් මස 17 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට මාසයකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 මැයි මස 08 දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 අප්‍රේල් මස 30 වැනි දින දහවල් 12. 00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට්* පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය. "

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**ආර්. ඒ. පී. කේ. ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


1 - B 082786 — - (2026/04)
F 1 -

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**වයඹ පළාත් සභාව**

වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයේ ජනපද නිලධාරි III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ ජනපද නිලධාරි III ශ්‍රේණියේ පවතින පුරප්පාඩු 06 ක් පිරවීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ලත් වයඹ පළාතේ ස්ථිර පදිංචි ශ්‍රී ලාංකික ස්ත්‍රී / පුරුෂ දෙපාර්ශ්වයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2026 මැයි මාසයේදී කුරුණෑගල නගරයේ පිහිටවනු ලබන විභාග මධ්‍යස්ථානයකදී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කෙරේ.

*සංලක්ෂය.- යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.*

01. **අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් :**

1.1 අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව සහ ගණිතය ඇතුළුව සම්මාන හතරක් සහිතව එකවර විෂයයන් හයකින් සමත් වීම ;

*සහ*

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී රසායන විද්‍යාව, ජීව විද්‍යාව සමග කෘෂි විද්‍යාව හෝ භෞතික විද්‍යාව යන විෂයයන් සියල්ලම එකවර සමත් වීම.

*සංලක්ෂය.- අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතු භාෂාව ලෙස සලකනු ලබන්නේ විභාගයට අයදුම් කරනු ලබන භාෂා මාධ්‍යය වේ.*

1.2 වෘත්තීය සුදුසුකම් :

I. කුණ්ඩසාලේ, අගුණකොළපැලැස්ස, පැල්වෙහෙර, ලබුදූව, කරපිංච, වාරියපොල, බිබිල, වවුනියාව සහ අනුරාධපුර කෘෂිකර්ම විද්‍යාල මගින් නිකුත් කරනු ලබන දෑ අවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම ;

*හෝ*

II. අම්පාරේ හාඩි කාර්මික විද්‍යාලය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික (කෘෂිකර්ම) ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම ;

*හෝ*

III. ඇක්වයිනාස් විද්‍යාලය මගින් නිකුත් කරනු ලබන දෑ අවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම ;

*හෝ*

IV. රජයට අනුබද්ධ අනුමත ආයතනයක් විසින් පිරිනමනු ලබන දෑ අවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

*සංලක්ෂය:*

*1. මෙම බඳවා ගැනීම් සිදු කරන විට රජයෙන් අනුමත වෙනත් කෘෂිකර්ම විද්‍යාල වේ නම් ඒවා ද ඇතුළත්ව එම විද්‍යාල මගින් නිකුත් කරනු ලබන දෑ අවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමා සහතික වලංගු වේ.*

*2. ඉහත රජයට අනුබද්ධ ආයතනයක් යනු උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ වන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි ආයතන වේ.*

02. **වැටුප් පරිමාණය:**

මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය 2025.01.01 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I හි MN 3 – 2025 අනුව රු. 52,250 -10 x 800 -11 x 1190 - 10 x 1320 - 10 x 1350 - රු. 100,040/- (2027.01.01 දක්වා එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන III හි සඳහන් පරිදි වැටුප් ගෙවනු ලැබේ.)

03. **වෙනත් සුදුසුකම්:**

3.1 අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

3.2 සෑම අපේක්ෂකයකුම වයඹ පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

3.3 අයදුම්කරු අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන විට වයඹ පළාතේ පූර්වාසන්න වසර 03 ක කාලයක්වත් ස්ථිරව පදිංචිව සිටි අයකු බවට ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද පදිංචි සහතිකයක් **(DS 04 ග්‍රාම නිලධාරි සහතිකය)** මගින් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී පදිංචිය සනාථ කළ යුතුය. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන විට වයඹ පළාතේ ස්ථිර පදිංචිය පූර්වාසන්න වසර 03 කට වඩා අඩු අයදුම්කරුවන් ද තමන් පදිංචි කාල සීමාව DS 04 ග්‍රාම නිලධාරි සහතිකයක් මගින් තහවුරු කළ යුතුය.

3.4 අයදුම්කරුහට අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන විට වයඹ පළාතේ ස්ථිර පදිංචිය පූර්වාසන්න වසර 03 කට වඩා අඩුවන අවස්ථාවල දී, අයදුම්කරුගේ කලත්‍රයා හට වයඹ පළාතේ අවම වසර 03 ක කාලයක්වත් ස්ථිර පදිංචිය තිබේ නම්, එම අයදුම්කරුවන් පිළිබඳව ද ඉහත 3.3 වගන්තිය ප්‍රකාරව සලකා බැලේ. කලත්‍රයාගේ පදිංචි සහතිකය (DS 04 ග්‍රාම නිලධාරි සහතිකය) හා විවාහ සහතිකය සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතු ය.

3.5 අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය.

3.6 තනතුරට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

04. **සේවා කොන්දේසි:**

4.1 මෙම තනතුර ස්ථිරය. සේවයට අදාළ විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් වේ.

4.2 මෙම තනතුරට පත් කරනු ලබන්නන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත්කරනු ලබන අතර, පරිවාස කාලය තුළ සිය රාජකාරි වැඩ සහ හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් හා පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව තිබේ නම් හා සේවය ස්ථිර කිරීම සඳහා වන අනෙකුත් අවශ්‍යතාවන් සම්පූර්ණ කර තිබේ නම් පරිවාස කාලය අවසානයේ සේවය ස්ථිර කරනු ලැබේ.

4.3 රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධරයන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළදී ලබා ගත යුතු ය.

4.4 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව සේවයට බැඳී වසර 03 ක් ඇතුළත සේවයට බැඳුන භාෂා මාධ්‍යයට අතිරේක වශයෙන් අනෙකුත් රාජ්‍ය භාෂාව/ භාෂා පිළිබඳ ප්‍රවීණතාවය නියමිත මට්ටමට ලබා ගත යුතු ය.

4.5 III වන ශ්‍රේණියේ වසර 05 ක් ඉක්මවීමට පෙර ඉංග්‍රීසි භාෂාව පිළිබඳ අ.පො.ස (සා.පෙළ) සම්මාන මට්ටමේ ප්‍රවීනතාවයක් ලබා ගත යුතු ය.

4.6 මෙම තනතුර සඳහා වන බඳවා ගැනීමේ/උසස් කිරීමේ පටිපාටියේ රෙගුලාසි හා ඒ අනුව පැවරෙන කාර්යභාරයට අමතරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද වයඹ පළාත් කාර්ය පටිපාටික රීති, වයඹ පළාත් මූල්‍ය රීති සංග්‍රහයට හා විනය කාර්යය සංග්‍රහයට ද දෙපාර්තමේන්තු නියෝගවලට ද වයඹ පළාත් සභා තාක්ෂණ

සේවයේ සේවා ව්‍යවස්ථාවට ද රාජ්‍ය හා වයඹ පළාත් සභාව විසින් නිකුත් කර ඇති හා වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි වලට හා නියෝගවලට ද අනුකූලව ක්‍රියා කිරීමට සියලුම නිලධාරින් බැඳී සිටී.

05. **බඳවා ගැනීමේ ක්‍රමය:**

5.1 වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන විවෘත තරග විභාගයක ප්‍රතිඵල මත සියලු පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සිදු කෙරේ.

5.2 ලිඛිත විභාගයේ එක් එක් ප්‍රශ්නපත්‍රයට 40% ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබාගන්නා අයදුම්කරුවන්ගේ විෂයයන් 02 හිම ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙළ මත පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දීමක් සිදු නොකරන අතර අධ්‍යාපන, වෘත්තීය ඇතුළු මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම හා ශාරීරික යෝග්‍යතාව පරීක්ෂා කර බැලීම සිදු කරනු ලැබේ.

06. **ලිඛිත විභාගය:**

6.1 ලිඛිත විභාගය සඳහා සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන එක් භාෂා මාධ්‍යයකින් ඉල්ලුම් කළ හැකි අතර, ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නො ලැබේ.

6.2 මෙම විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. සවිස්තරාත්මක විභාග විෂයය නිර්දේශය පහතින් දක්වා ඇත :

| *ප්‍රශ්නපත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු ප්‍රතිශතය* |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| 2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය (බහුවරණ ප්‍රශ්නපත්‍රයකි) | පැය 01 | 100 | 40% |

**විෂයය නිර්දේශය :**

***බුද්ධි පරීක්ෂණය***

අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාව, විශ්ලේෂණ හැකියාව, කාල කළමනාකරණය, විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් යුක්තය.

***විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය***

01. ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා කෘෂිකර්මාන්තයේ දායකත්වය :

(අ) දළ ජාතික නිෂ්පාදනයට කෘෂිකර්මාන්තයේ දායකත්වය
(ආ) රැකියා නියුක්තිය
(ඇ) කෘෂිකර්මාන්තයේ අපනයන ආනයන තත්වය

02. ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප පිළිබඳ දැනුම

03. පස සහ ශාක පෝෂණය :

(අ) පසේ ව්‍යුහය, වයනය, භෞතික හා රසායනික ලවණතාවය හා භෝග වගාව කෙරෙහි එහි බලපෑම.
(ආ) ශාක පෝෂණය, පාංශු / ශාක පෝෂණ කළමනාකරණය.
(ඇ) පැළෑටි පෝෂණය පිළිබඳ විශේෂ කරුණු.

04. පාංශු රසායන පාංශු සංරක්ෂණයේ වැදගත්කම හා විවිධ පාංශු සංරක්ෂණ ක්‍රම.

05. වාරිමාර්ග ක්‍රම හා ජල කළමනාකරණය :

(අ) විවිධ භෝග වර්ග සඳහා උචිත ජල සම්පාදන ක්‍රම හා ඒවායේ ජල කළමනාකරණය
(ආ) ක්ෂුද්‍ර ජල කළමනාකරණ ක්‍රම
(ඇ) ජල වහනය හා එහි වැදගත්කම

06. ගොවිපල යාන්ත්‍රීකරණය :

(අ) ගොවිපල යාන්ත්‍රීකරණයේ වාසි අවාසි
(ආ) බිම් සකස් කිරීමට භාවිතා කරන කෘෂි යන්ත්‍රෝපකරණ
(ඇ) ජල සම්පාදන හා පැළෑටි ආරක්ෂණය සඳහා භාවිත කරන කෘෂි යන්ත්‍රෝපකරණ
(ඈ) ඉහත යන්ත්‍ර ක්‍රියා කරවීම හා නඩත්තුව

07. කෘෂිකාර්මික ව්‍යාප්තිය :

(අ) කෘෂිකාර්මික ව්‍යාප්ති උපායමාර්ග හා ක්‍රමවේදය
(ආ) කෘෂිකාර්මික ව්‍යාප්ති සන්නිවේදන ක්‍රම

08. පටක රෝපණය :

(අ) පටක රෝපණයේ මූලික සිද්ධාන්ත හා අතීත තොරතුරු පිළිබඳ දැනුම
(ආ) පටක රෝපණයේ භාවිතයන් / යෙදීම් උදාහරණ
(ඇ) පටක රෝපණයේ වාසි අවාසි

09. පැළෑටි නිරෝධායනය පිළිබඳ දැනුම :

(අ) පැළෑටි නිරෝධායන රෙගුලාසි පිළිබඳ දැනුම
(ආ) පැළෑටි නිරෝධායන ක්‍රම

10. ශාක සංරක්ෂණය :

(අ) ශාක සංරක්ෂණයේ වැදගත්කම ( ශාක/ ජාන ප්ලාස්ම)
(ආ) ශාක සංරක්ෂණයේ ක්‍රම ( ශාක/ ජාන ප්ලාස්ම)

11. ජාන තාක්ෂණය :

(අ) DNA වල වැදගත්කම
(ආ) ජානය යනු කවරෙක්ද, එහි ක්‍රියාකාරීත්වය
(ඇ) DNA තාක්ෂණය යොදා ගැනීමේ අවස්ථා
(ඈ) ජාන ඉංජිනේරු ශිල්ප ක්‍රම මගින් ශාක වැඩි දියුණු කිරීමට ඇති හැකියාව

12. ශ්‍රී ලංකාවේ ජනපද ව්‍යාපාරය හා මහවැලි ව්‍යාපාරය පිළිබඳ දැනුම

(අ) ජනපද ව්‍යාපාරය පිහිටුවා ඇති ස්ථාන
(ආ) මහවැලි ව්‍යාපාරයට අයත්වන ප්‍රදේශ

13. ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීම පිළිබඳ දැනුම.

14. සිතියම් ආශ්‍රිත කරුණු පිළිබඳ දැනුම:

(අ) අනිලමානය, රෝඩ්රේසය, ඩම්පිලෙවලය, තියෝඩර්ලයිටරය
(ආ) 1:50,000 – 1 : 10,000 අඟලේ සිතියම් හා අවසාන ගම් පිඹුර පිළිබඳ විස්තර

15. ශ්‍රී ලංකාවේ දැනට පවතින ඉඩම් පිළිබඳ හා ඒ සම්බන්ධ දෙපාර්තමේන්තු, ආයතන පිළිබඳ දැනුම

(අ) ඉඩම් වර්ග - රජයේ ඉඩම් / පුද්ගලික ඉඩම් / ප්‍රවේණි ඉඩම්

16. ඉඩම් සංවර්ධනය හා බෙදාදීම පිළිබඳ දැනුම :

(අ) වර්තමානයේ ඉඩම් සංවර්ධනය හා බෙදා දීම පිළිබඳ ක්‍රියාත්මක ජාතික වැඩසටහන් පිළිබඳ අවබෝධය, ඉඩම් නොමැති පුද්ගලයින් හඳුනා ගැනීම
(ආ) බිම්සවිය වැඩසටහන
(ඇ) ඉඩම් කැබලි ලක්ෂයේ වැඩසටහන

17. රජ සමයේ සිට මේ දක්වා ඉඩම්වල අයිතිය බැහැර කිරීමට යොදාගත් ලේඛන පිළිබඳ අවබෝධය:

(අ) සන්නස්, නින්දගම්
(ආ) බදුකර, ස්වර්ණ භූමි, ජය භූමි, රත්න භූමි, රන්බිම

07. **විභාග ගාස්තු :**

විභාග ගාස්තු වශයෙන් රු. 1,200/- ක මුදලක් වයඹ පළාත් සභාවේ අංක 2003-02-13 දරන ආදායම් ශීර්ෂයට බැරවන පරිදි ගෙවිය යුතුය. වයඹ පළාතේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදල් ගෙවා ලබා ගත් ව.ප.ස.මු.02 ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ අලවා ඉදිරිපත් කළ යුතුය. එසේ මුදල් ගෙවා ලබාගත් ලදුපත හැර වෙනත් ලදුපත් හෝ මුදල් ඇණවුම් කිසිවක් භාරගනු නොලැබේ . කුමන හේතුවක් නිසා හෝ ගෙවූ විභාග ගාස්තු ආපසු නොගෙවන බව ද එම විභාග ගාස්තු වෙනත් කවර හෝ විභාගයක් සඳහා මාරු කිරීමට ඉඩ දෙනු නොලබන බව ද සැලකිය යුතු ය. **(රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතු ය.)**

08. ***අයදුම් කළ යුතු ක්‍රමය :***

8.1 මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත සකස් කරගත යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2026.05.18 වැනි දින හෝ එදිනට පෙර ලැබෙන පරිදි පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ තැපැල් කුරියර් සේවාව මගින් යොමු කළ යුතු ය.

ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
වයඹ පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.

අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි, **"ජනපද නිලධාරි III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026"** යනුවෙන් සඳහන් කළ යුතු ය.

8.2 නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන හෝ නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හෝ ප්‍රමාද වී ලැබෙන හෝ අපැහැදිලි හා අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තව ද සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතියට අනුකූල ද යන්න පිළිබඳව විමසා බැලීම අයදුම්කරු සතු වගකීමකි. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරු විසින්ම දරාගත යුතුය. අයදුම්පත් ලැබුනු බව දන්වනු නොලැබේ. (අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

*වැදගත්:* අයදුම්පත්‍රය පිරවීමේදී සැලකිලිමත්ව නිවැරදි තොරතුරු සැපයිය යුතු ය. එම තොරතුරු කිසිදු අයුරකින් සංශෝධනයට ඉඩදෙනු නොලැබේ.

8.3 **අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2026.05.18 වේ.**

09. **අයදුම්කරුගේ අත්සන සහතික කිරීම:**

අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකරුවෙකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රු. 71,240 කට වැඩි මූලික මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික නිලධාරියකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

10. **අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය:**

විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

i. ජාතික හැඳුනුම්පත ;
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය ;
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳ ගෙන නොමැති බව තහවුරු කරගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

***සටහන*** : විභාග ශාලාවේදී තම අනන්‍යතාවය තහවුරු කිරීමට අපේක්ෂකයකු අපොහොසත් වුවහොත් ඔහු/ඇය විභාගයට පෙනී සිටීම සඳහා නුසුදුස්සකු ලෙස සලකනු ලැබේ.

11. විභාග නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදා ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කාල සටහනේ පිටපතක් සමග විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ (www.psc.nw.gov.lk) වෙබ් අඩවියේ නිවේදනයක් පළකරනු ලැබේ. විභාගය පැවැත්වෙන දිනට දින 03 කට පෙර විභාග ප්‍රවේශපත්‍රය නොලැබිණි නම්, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග අංශයට දැනුම් දිය යුතු ය.

12. මෙම විභාගයේ නීති රීති අනුව යම් අයදුම්කරුවකු විභාගයට පෙනී සිටීමට නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් ඔහු හෝ ඇය වයඹ පළාත් සභා රාජ්‍ය සේවයෙන් පහ කිරීමට පිළිවන. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රය නිකුත් කිරීම ඔහු හෝ ඇයට විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

13. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාළ කරුණු හෝ එම නිවේදනයෙන් ආවරණය නොවන හෝ එම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති වෙනත් කිසියම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ.

14. මෙම විභාගය පැවැත්වීම, කල් දැමීම, අවලංගු කිරීම හෝ පැවැත්වීමෙන් පසු තෝරා ගැනීම / නොගැනීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳ අවසාන තීරණය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

15. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එන්. එම්. ජේ. ප්‍රනාන්දු
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

**ආදර්ශ අයදුම්පත්‍රය**

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

**වයඹ පළාත් සහා රාජ්‍ය සේවයේ පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයේ ජනපද නිලධාරි III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026**

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය ( අදාළ කොටුවේ √ ලකුණ යොදන්න)

සිංහල : දෙමළ : ඉංග්‍රීසි :

01. 1.1 මුලකුරු සමග නම (**සිංහලෙන්**) :

………………………………………………………………………………………………………………
……………………………………………………………………………………(මයා/මිය/ මෙනවිය)

1.2 මුලකුරු සමග නම (**ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්**) :

(Mr./Miss/Mrs.) ……………………………………………………………………………………
………………………………………………………………………………………………………………

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්) :

………………………………………………………………………………………………………………
………………………………………………………………………………………………………………

1.4 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :

………………………………………………………………………………………………………………
………………………………………………………………………………………………………………

1.5 ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

02. 2.1 ස්ථිර පදිංචි ලිපිනය (**සිංහලෙන්**) :

………………………………………………………………………………………………………………
………………………………………………………………………………………………………………

2.2 ස්ථිර පදිංචි ලිපිනය (**ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්**) :

………………………………………………………………………………………………………………
………………………………………………………………………………………………………………

2.3 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය (**ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්**):

………………………………………………………………………………………………………………
………………………………………………………………………………………………………………

2.4 දුරකතන අංකය :……………………………………………………………………..

2.5 විද්‍යුත් තැපැල් ලිපිනය (email) : ……………………………………………………………

03. 3.1 ස්ත්‍රී/ පුරුෂ භාවය : ස්ත්‍රී : පුරුෂ :

3.2 උපන් දිනය : වර්ෂය : [ ][ ][ ][ ] මාසය : [ ][ ] දිනය : [ ][ ]

3.3 2026.05.18 දිනට වයස: අවුරුදු :……....….. මාස :………...…. දින :……....….

04. 4.1 අයදුම්කරු පදිංචි පරිපාලන දිස්ත්‍රික්කය : ………………………………….........……….……..

4.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :…………………………………………………...……..………

4.3 ග්‍රාම නිලධාරි කොට්ඨාසය :…………………………………………………………………….

4.4 2026.05.18 දිනට වයඹ පළාතේ ස්ථිර පදිංචිය: අවු. …………. මාස ………… දින …...…….

5.0 **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :**

5.1 අ.පො.ස (සාමාන්‍ය පෙළ) :

විභාගයේ වර්ෂය :……...................…… මාසය :…………....……….. විභාග අංකය :…………………….

| | විෂයය | සාමාර්ථය | | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|---|---|
| 1. | | | 6. | | |
| 3. | | | 7. | | |
| 3. | | | 8. | | |
| 4. | | | 9. | | |
| 5. | | | 10. | | |

5.2 අ.පො.ස (උසස් පෙළ) :

විභාගයේ වර්ෂය :……..................……. මාසය :….......…………. විභාග අංකය :……………..

| | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| 1. | | |
| 3. | | |
| 3. | | |
| 4. | | |

5.3 වෘත්තීය සුදුසුකම් :

| ආයතනය | හැදෑරූ පාඨමාලාව | කාලසීමාව | සාමාර්ථය | සහතිකපත් අංකය හා දිනය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |

6.0 **විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :**

6.1 ලදුපත් අංකය :…………….. මුදල :………………. දිනය :………………………

මුදල් ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :…………………………………………………………

| |
|---|
| ලදුපත මෙහි අලවන්න. |

7.0 **අයදුම්කරුගේ සහතිකය :**

(අ) මෙම අයදුම්පත්‍රයේ ම විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ද, මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳ දරා ගැනීමට ද මම එකඟ වෙමි.

(ආ) ම විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් මෙම තනතුරට පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම් ලැබීමෙන් පසු සේවය අවසන් කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

………………… …………......…………,

දිනය අයදුම්කරුගේ අත්සන.

8.0 **අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :**

මෙහි අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයකු/ විශ්‍රාමික ආයතන ප්‍රධානියකු/ කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි තැන/ සාමදාන විනිශ්වයකරුවකු/ දිවුරුම් කොමසාරිස්වරයකු/ නීතිඥවරයකු/ ප්‍රසිද්ධ නොතාරිස් කෙනකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධරයකු/ පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 71,240/- කට වැඩි මූලික මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනකු හෝ අන්‍යාගමික පූජ්‍ය ස්ථානයක භාරකාරීත්වය දරන කෙනකු හෝ මගින් සහතික කරවා ගත යුතු ය.

මෙම අයැදුම්පත ඉදිරිපත් කරනු ලබන ............................................................ මයා/මිය/මෙනවිය, මා පෞද්ගලිකව හඳුනන බව ද ඔහු/ඇය මා ඉදිරිපිට දී ........................... දින ඔහුගේ/ ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

| | |
|---|---|
| අත්සන | : ....................................................................... |
| සහතික කරන අයගේ නම | : ....................................................................... |
| තනතුර හා නිල මුද්‍රාව | : ....................................................................... |
| දිනය | : ....................................................................... |

04-299

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.